

# කැළෑ ගමේ ගිනි නිවන හමුදාව


**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

1 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# කැළෑ ගමේ ගිනි නිවන හමුදාව



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

1 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කෘතියේ නම : කැළෑ ගමේ ගිනි නිවන හමුදාව

ප්‍රථම මුද්‍රණය : 2023.11.15

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 1 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-208-088-8

පරිගණක අක්ෂර, පිටු සැකසුම හා වර්ණ ගැන්වීම්
අධීක්ෂණය : සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- කිටියාට පාඩමක්...
- මම ආසයි ඉගෙනගන්න...
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 1 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තුතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී  ගුරු මෑණියන්ටත්,

එම ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ISBN කේත ලබාගැනීම සඳහා නොමඳ සහයක් ලබා දුන්

4 ශ්‍රේණියේ සතිනි දියණියගේ මව වන

ලුම්බිණි මහත්මියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත්, සහ

මල්ලීට


මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.




කැළෑවටත් අපිට වගේ ම ගිනි නිවන හමුදාවක් තිබුණා.

ඒ කවුද දන්නවද?


උකුස්සා, චීටා, අලියා, රයිනෝසිරස්, ජිරාෆ්, වඳුරා සහ බීවරයා.




උකුස්සා, එයාට දුර පෙනෙනවා.  පියාඹලා යද්දී කැළෑවේ කොහේ හරි ගින්නක් ඇවිලිලා නම් එයාට ඒක පෙනෙනවා.




චීටා, එයා හරි ම වේගවත් එයත් කැළෑවේ කොහේ හරි ගින්නක් ඇති වෙලා නම් ඒක ආරංචි වුණා ගමන් පණිවිඩය අනිත් යාළුවන්ටත් කියනවා. හැමෝටම ඉක්මනට අනතුරු අඟවනවා.




බීවරයා දන්නවා, වතුර පාරවල් හරස් කරලා වේලි බඳින්න.
ඇළවල් හදන්න.



එයාට පුළුවන් කැළෑවේ ලොකු ගඟෙන් ඕන ම තැනකට වතුර ගෙනියන්න ඇළක් හදන්න. ඒ හින්දා, එයා කැළෑවේ ගිනි නිවන හමුදාවේ වැඩකරනවා.




එහෙම, ධීවරයා හදාගන්න වතුර පාරෙන් වතුර, හොඬවැලට ගන්න අලියා ගින්න තියන පැත්තට වේගයෙන් විදිනවා, ගින්න නිවෙනකම් ම.



රයිනෝසිරස්ට කකුල් වලින් බිම තියන ගිනි ගොඩවල් පාගලා නිවන්න, ගිනිගන්න තැන් හොයාගෙන යන්න පුළුවන්. ඒ වගෙමයි එයා හරිම ශක්තිමත්. හදිසියක දී බර දේවල් තල්ලුකරන්න, එයා අලියාට උදව් කරනවා.



ගිනි නිවන හමුදාව ළඟ දොඹකර, ඉනිමං එහෙමත් තියනවනේ, ඒ වගේ වැඩවලට කැළෑවේ නම් ඉන්නේ, ජිරාෆ් තමයි. එයාගේ දිග ම දිග බෙල්ල ඉනිමගක් වගේ, උස තැන්වලට ළං වෙන්න පුළුවන්.



වඳුරා තමයි, ජිරාෆ්ගේ බෙල්ල දිගේ ම ගිහින් උස තැන්වල ඉන්න අයව බේරාගන්නේ.



මේ අය හරි ම එකමුතු යි කඩිසර යි, කැලෑවට ලොකු සේවයකුත් කරනවා.

යාළුවනේ, අපිත් ඉගන ගන්න ඕන, අපිට පුළුවන් දේවලින් අපේ දක්ෂකම් වලින්, අනිත් අයට හැම වෙලාවේ ම උදව් කරන්න. එහෙම වුණොත් අපේ ලෝකේ මීටත් වඩා ගොඩාක් ලස්සන වෙයි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01